ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීති වේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2021/2022
LLU4708 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතිය 11
කාලය - පැය (03) තුනයි

---

දිනය: 2023 ජනවාරි 25 වේලාව: පෙ.ව. 9.30 - ප.ව.12.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ
මුළු ප්‍රශ්න ගණන 08 යි
පළමු සහ දෙවන කොටසින් ප්‍රශ්න දෙක බගින් තෝරා ගනිමින් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු විස්සකි

## I කොටස

1. 'බොහෝ නූතන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවන්හි මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් දක්නට ලැබේ [...] අයිතිවාසිකම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය මට්ටමට එසැවීම තුලින් රජය ඒවා උල්ලංඝණය නොකරන ලෙස ශුද්ධත්වයක් ආරෝපණය කෙරේ'

   Jayampathy Wickremaratne, Fundamental Rights of Sri Lanka, 3rd ed. p.9

   ශ්‍රී ලංකාවේ පශ්චාත් යටත් විජිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ඉතිහාසයේ පසුබිම තුල ඉහත කී ප්‍රකාශය ලංකාවේ සන්දර්භයට අදාල වන්නේ කෙසේදැ'යි සාකච්ඡා කරන්න. පශ්චාත්-යටත් විජිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලීන් තුල මානව හිමිකම් සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය ආරක්ෂාව ලබාදීම නම් වූ සංකල්පය ක්‍රමානුකූලව ආයතනගත වූයේ කෙසේද යන්න ඔබගේ පිලිතුර තුල පැහැදිලි කල යුතුය.

2. ප්‍රභාත් යනු සමාජ මාධ්‍ය අවකාශය තුල කටයුතු කරන ස්වාධීන ජනමාධ්‍යවේදියෙකි. ඔහු විසින් සමකාලීන සමාජ හා දේශපාලන කරුණු පිලිබඳ අදහස් දැක්වීම සඳහා පවත්වාගෙන යන යූටියුබ් චැනලය විශාල වශයෙන් ප්‍රේක්ෂක අවධානයට හසුවන්නකි. ආන්ලෝදනාත්මක ප්‍රකාශ සිදුකිරීම සම්බන්ධව ඔහු ප්‍රසිද්ධියක් උසුලයි. ආගමික නිවාඩු දිනවල මත්පැන් විකිණීම තහනම් කිරීම පිලිබඳ අදහස් දක්වමින් උඩුගත කල වීඩියෝවක පහත ප්‍රකාශය සිදු කලේය :

   '...ආගමික වශයෙන් වැදගත් කියලා කියන දවස්වල මත්පැන් අලෙවි සැල් වහන්න රජය කටයුතු කරන්න ඕනෑ කියලා මා හිතන්නේ නැහැ. මේවා අපි ප්‍රසිද්ධියේ නොකීවට, අපි හැමෝම දන්නවා පූජ්‍ය පක්ෂයේ අය කියන්නේ ගිහියෝ වගේම තෙම්පරාදු වෙච්ච බේබද්දො කියලා. මේ දෙබිඩ්ඩන්ට බැහැ අපේ ජීවන රටාව ගැන නීති පනවන්න'.

   මෙම වීඩියෝව බෙහෙවින් ප්‍රසිද්ධ වූ අතර පූජ්‍ය පක්ෂය වෙත සැඳහුම් කිරීම සඳහා බේබද්දන් යන වචනය යොදාගැනීම විවිධ ආගමික කණ්ඩායම් අතර කෝපාන්විත ප්‍රතිචාරයක් ජනිත කලේය. පොලිසියට ලැබුණු පැමිණිල්ලක් මත, 2022 මාර්තු 3 වන දා ප්‍රභාත් නිවෙස බලා වැඩ

අවසන් වී යමින් සිටින අතර අත්අඩංගුවට ගැනුණි. ප්‍රභාත්ගේ ප්‍රකාශය නිසා පෞද්ගලිකවම කුපිත වී සිටි අයෙක් වන අදාල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් ස්ථානයේ වූ වෙනම කුටියක දවස් දෙකක් ප්‍රභාත්ව සිර කිරීමට කටයුතු කලේය. කුටිය තුල දී ඔහුව නිරුවත් කෙරුණු අතර, මුලු රැඳවුම් කාලය තුලම ඔහුව නිර්වස්ත්‍රව රඳවා තැබුණි. වරින් වර කුටියට ගිය ස්ථානාධිපති ඇතුලු පොලිස් නිලධාරීන් ඔහුට වාචිකව හිංසා කල අතර, 'උඹට පාඩමක් උගන්නනවා' යැයි තර්ජනය කලහ. ඔහුට දවසට දෙන ලද්දේ කැඳවලින් සමන්විත එක් ආහාර වේලකි. එතුලින් 'මහත් දුගඳක් ආ බවට' පසුව ප්‍රභාත් විස්තර කලේය. 2022 මැයි 6 වන දා ඔහුව මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියට පමුණුවන ලදී. 'ප්‍රජාවන් අතර වෛරය ඇවිලවීමට කටයුතු කිරීම' නම් වූ වරද යටතේ ඔහුට විරුද්ධව චෝදනා ගොනු කෙරුණි. ඇප මත මුදා හල පසුව, පොලිසියේ ක්‍රියාකලාපයට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට ප්‍රභාත් අපේක්ෂා කරයි.

ප්‍රභාත්ගේ නීතිඥවරයා ඔබ යැයි උපකල්පනය කරමින්, ඔහුට ඉදිරිපත් කල හැකි යාචනයන් (claims) කවරේදැ'යි සඳහන් වන සටහනක් පිලියෙල කරන්න. සටහන සකස් කරන විට, වග උත්තරකරු විසින් ඉදිරිපත් කල හැකි ප්‍රති-යාචනයන් ද ඔබ විසින් සාකච්ඡා කල යුතුය.

3. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත මූලික අයිතිවාසිකම් නීති පද්ධතිය තුල අත්පත් කරගත් වඩාත්ම කැපී පෙනෙන ජයග්‍රහණයක් වන්නේ නීතිය ඉදිරියේ සමාන රැකවරණය නම් වූ සංකල්පයට අපගේ අධිකරණ විසින් ලබා දී තිබෙන පුලුල් අර්ථනිරූපණයයි.

මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? අදාල නඩු නීතිය වෙත අවධානය යොමු කරමින්, ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

4. පීකබූ රාජ්‍යය යනු වේගවත් ආර්ථික සංවර්ධන වැඩපිලිවෙලක් ක්‍රියාවට නංවා තිබෙන සංවර්ධනය වෙමින් පවතින රටකි. එම රටේ නව ආර්ථික වැඩපිලිවෙලෙහි අංගයක් ලෙස, රජයට අයත්ව තිබූ විදුලි බල මණ්ඩලය ඇතුලු රාජ්‍ය ව්‍යවසායන් විශාල ප්‍රමාණයක් පෞද්ගලීකරණයට කටයුතු කොට තිබේ. විදුලි බල මණ්ඩලය මේ වනවිට Pekaboo Electro PLC. නමින් හැඳින්වෙන පොදු ලැයිස්තුගත සමාගමක අයිතිකාරීත්වය යටතේ පවතී. මෙම සමාගමේ කොටස් සියයට 49 ක් රජය සතු වන අතර, බහුතර කොටස්වල අයිතිය විදේශ සමාගමක් සතු වේ.

පහත තීරණ ක්‍රියාත්මක කිරීමට Pekaboo Electro PLC. ආයතනය කටයුතු කරයි.

- ගම්බද ප්‍රදේශවලට විදුලිය සැපයීම සඳහා ඉහල ගාස්තුවක් අය කිරීම. ගම්බද ප්‍රදේශවල විදුලිය සඳහා වන ඉල්ලුම අඩු නිසා, පාඩු ලැබීමකින් තොරව ආයතනය පවත්වා ගැනීමට නම් එම ප්‍රදේශවලින් ඉහල ගාස්තුවක් අය කිරීමට සිදුවන බව සමාගම කියයි. ගම්බද ප්‍රදේශවල ගොවි ප්‍රජාවන් සමග කටයුතු කරන සමාජ ක්‍රියාකාරිකයෙක් වන ගුහා මහතා කල්පනා කරන්නේ මෙලෙස ගාස්තු වැඩි කිරීම නිසා සැලකිය යුතු ගම්බද ජනතාවකට විදුලිය සඳහා වූ ප්‍රවේශය අහිමි වනු ඇති බවය.

- රට පුරා වන ගංගා හා ඇල දොල කේන්ද්‍රකරගත් කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර විස්සක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම. කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාර නිසා අවට වූ පරිසරයට සිදු විය හැකි බලපෑම සම්බන්ධව පරිසරවේදීන් සැක සංකා මතු කරති. Earth-Mates නම් වූ සිවිල් සමාජ සංවිධානය යෝජිත

ව්‍යාපෘතිය පිලිබඳ තොරතුරු විමසමින්, සමාගම වෙත ලිපියක් යවයි. තොරතුරු ලබාදීම සමාගම ප්‍රතික්ෂේප කරයි.

Pekaboo Electro විසින් ගනු ලැබූ තීරණ අභියෝගයට ලක්කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට හැකියාවතිබේදැ'යි ගුහා මහතා හා Earth-Mates සංවිධානය ඔබගෙන් උපදෙස් පතයි. පහත කරුණු සම්බන්ධව ඔවුන්ට උපදෙස් දෙන්න :

(a) Pekaboo Electro ආයතනයට එරෙහිව නඩුකරයක් ගොනු කල හැකිද?;

(b) එබඳු නඩුකරයක දී පෙත්සම්කරුවන්ට මතු කල හැකි පදනම් (grounds) මොනවාද?;

(c) ගුහා මහතාට හා Earth-Mates සංවිධානයට මූලික අයිතිවාසිකම් නඩුකරයක් ගොනු කිරීමේ ශක්තතාවය පවතීද?

පීකබූ රාජ්‍යයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හා මූලික අයිතිවාසිකම් නඩු නීතිය ශ්‍රී ලංකාවට සමාන බවට උපකල්පනය කරන්න. අදාල නඩු නීතිය වෙත සැඳහුම් කරමින් ඔබගේ පිලිතුර ගොනු කල යුතුය.

## II කොටස

5. 'ලිබරල් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවාදය පිලිබඳ සංකල්පනයේ කේන්ද්‍රීය අවධානය යොමුවන්නේ බහුතරවාදය සීමා කිරීම කෙරෙහිය. ව්‍යවස්ථාදායකයේ අත්තනෝමතිකත්වය ඇති වීම වැලැක්වීම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවාදය අරමුණු කරගනී'.

   ඉහත කී ප්‍රකාශයේ පසුබිම තුල, ශ්‍රී ලංකාවේ ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවන් කෙතරම් දුරට ලිබරල් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවාදයේ නියාමයන් පිලිබිඹු කරයි දැ'යි විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ඔබගේ පිලිතුර වෙනත් රටවල් <u>දෙකක</u> ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවන් සමග කෙරෙන සංසන්දනයක් ලෙස ඉදිරිපත් කල යුතුය.

6. ශ්‍රී ලංකාවේ බලය බෙදීමේ ව්‍යුහය වැඩි දියුනු කිරීම සඳහා ආණ්ඩුව විසින් 'පත්කල කොමිසමකට අනුබද්ධ පර්යේෂණ සහයකයෙක් ලෙස ඔබව පත් කරනු ලැබ තිබේ යැයි උපකල්පනය කරන්න. ඔබට දෙන ලද පැවරුමක කොටසක් ලෙස, *13 වන සංශෝධනය පිලිබඳ කරුණ (1987) 2 Sri. LR 312* නඩු තීරණය සම්බන්ධව නඩු තීන්දු වාර්තාවක් සැපයීම පැවරී තිබේ. අදාල නඩු තීරණයේ බහුතරයේ හා සුලුතරයේ තීරණ පිලිබඳ සංක්ෂිප්තයක් ඔබ විසින් සැපයිය යුතුය. තවද, නඩු තීරණය තුල පලාත් සභාවල බලතල වපසරිය පිලිබඳ දෙනු ලැබූ අර්ථනිරූපණය බලය බෙදීම පිලිබඳ පුලුල් සංකල්පනයකට කෙතරම් දුරට අනුකූල වන්නේද යන්න ගැන ඔබගේ අදහස කොමිසම විසින් විමසා සිටී.

7. 'ෆෙඩරල්වාදය, බලය බෙදීම හා බලය විකේන්ද්‍රණය ආදී විවිධ බලය බෙදාගැනීමේ ආකෘතීන් ඒවායේ පරාසය අතින් විවිධ වූ රූපාකාරයන් ගනු ලැබුවද, ඒවා මගින් අපේක්ෂා කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරනය සම්බන්ධ වඩා ප්‍රතිචාරාත්මක හා වගකීම්සහගත ක්‍රමවේදයක් සහතික කිරීම හා දේශපාලන බහුවිධතාවය සඳහා පලල් අවකාශයක් සපයාදීමය'.

ශ්‍රී ලංකාව ඇතුලු රටවල් තෝරාගත් රටවල් තුනක ආණ්ඩු ක්‍රම සැකැස්ම තුල කේන්ද්‍රය හා පරිවාර ඒකක අතර බලය බෙදාගනු ලැබ තිබෙන ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත කී ප්‍රකාශය සාකච්ඡා කරන්න.

8. පහත මාතෘකා පිලිබඳ කෙටි සටහන් ලියන්න.

(a) පලාත්බද මහාධිකරණය
(b) පලාත් සභා ක්‍රමය තුල ආණ්ඩුකාරවරයාගේ භූමිකාව
(c) පලාත් රාජ්‍ය සේවය
(d) පාර්ලිමේන්තුව හා පලාත් සභාවල ව්‍යවස්ථාදායක බලය අතර සම්බන්ධය

***** Copyright Reserved *****